# තොරතුරු දැන ගැනීමේ අයිතිය, රජය, නිලධාරීන් සහ යහපාලනය

- උවිඳු කුරුකුලසූරිය

ප්‍රජාතන්ත්‍රවාදය මූලික වශයෙන් අයත් වන්නේ සාමූහික වශයෙන් තීරණ ගැනීමේ තලයටය. කිසියම් සංවිධානයක සාමාජිකයන් සියලු දෙනා ගන්නා තීරණ එකී මුළු මහත් සංවිධානයටම බලපාන බැවින්, එම සාමාජිකයන් හැමදෙනාටම තීරණ ගැනීම සඳහා සහභාගිවීමේ අයිතිය සම සමව තිබිය යුතුය. වෙනත් වචනවලින් කියන්නේ නම්, ප්‍රජාතන්ත්‍රවාදය මූලධර්ම දෙකකින් සමන්විතය. සාමූහික වශයෙන් තීරණ ගැනීම සෑම දෙනාගේම පාලනයට යටත්ය, එම පාලනය ක්‍රියාවට නැංවීම සඳහා සෑම දෙනාටම එක හා සමාන අයිතිවාසිකම් හිමිය.

ප්‍රජාතන්ත්‍රවාදය මූලික වශයෙන් පස්වැදෑරුමකින් අගය කළ හැකිය ඃ

- ප්‍රජාතන්ත්‍රවාදයේ ඉලක්කය සියළුම ජනතාව පුද්ගලයන් වශයෙන් මෙන්ම කණ්ඩායම් වශයෙනුත් සමාන මව සැලකීමය.
- ප්‍රජාතනත්වාදී ආණ්ඩුක්‍රමය වෙනත් ආණ්ඩුක්‍රමවලට වඩා සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සපුරාලයි.
- ප්‍රජාතන්ත්‍රවාදය රඳා පවතින්නේ අදහස් උදහස් පිළිබඳ විවෘත විවාද පැවැත්වීමත්, ඒ සඳහා පෙළඹවීමත් ඒවා සමථයකට පත්කරගැනීමත් මතය.
- ප්‍රජාතන්ත්‍රවාදය යටතේ මූලික නිදහස සහතික කෙරේ.
- ගමන් මඟ වෙනස් කරමින් ඉදිරියට යාමට ප්‍රජාතන්ත්‍රවාදය සමාජයට ඉඩ සලසයි.

ප්‍රජාතන්ත්‍රවාදය ඉහතින් දක්වා ඇති ආකාරයට තේරුම් ගැනීමෙන් එක් දෙයක් පැහැදිලි වෙයි. එනම්, අප බොහෝ දෙනා සාමාන්‍යයෙන් සිතාගෙන සිටින අන්දමට, ප්‍රජාතන්ත්‍රවාදය හුදෙක් රාජ්‍යයට හෝ ආණ්ඩුවට හෝ පමණක් අයත් නොවන බවය. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ඕනෑම සංවිධාන රටාවක් තුළ භාවිතා වන සාමූහික තීරණවලට අදාළය. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය එක්කෝ /නැත්නම් වශයෙන් බෙදා දැක්විය හැකි සංකල්පයක් නොවේ. එය සාපේක්ෂ සංකල්පයකි. එහි දී සලකා බැලෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය කුමන මට්ටමකට ක්‍රියාවට නැංවී තිබෙනවාද යන කාරණයයි. සෑම දෙනාගේම පාලනය හා දේශපාලන සමානාත්මතාවය මොනතරම් දුරට සාක්ෂාත් වී තිබෙනවාද යන කාරණයයි. සාමූහික වශයෙන් තීරණ ගැනීමේදී මොනතරම් දුරකට සෑම දෙනාගේම සම සහයෝගීත්වය ලැබෙනවාද යන කාරණයයි.

එනමුත් ප්‍රජාතන්ත්‍රවාදය යන්න තවදුරටත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී කතිකාව තුළ දක්නට ලැබෙන දේශපාලන සංකල්පයට, එනම් කිසියම් නිශ්චිත අවුරුදු ගණනාවකට පසු නියෝජිතයන් තෝරාගැනීම සඳහා පවත්වන මැතිවරණයකට සීමා කොට පමණක් පවත්වාගෙන යන්නට නොහැකි වී තිබේ. ඇත්තම කියනවා නම්, මේ වන විට ප්‍රස්තුත මැතිවරණය, ආර්ථික බලය හා ජනමාධ්‍ය විසින් ස්වකීය වසඟයට ගැනීම නිසා විකෘත, බෙලහීන එකක් බවට පත්ව තිබේ. මෙකියන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍යය. එනමුත් එය ප්‍රමාණවත් නැත. අපට අවශ්‍ය වඩා ප්‍රශස්ත පන්නයේ සහභාගීත්ව ආකෘතිවලින් සමන්විත ප්‍රජාතන්ත්‍රවාදයක්ය.

සාම්ප්‍රදායික වශයෙන්, කිසියම් රාජ්‍යයක් ප්‍රජාතන්ත්‍රවාදී යැයි අප කියන්නේ එම රටේ ආණ්ඩුව එම රටේ ජනතාවට වගකියනවා නම් පමණි. එම රටේ ජනතාවගේ ප්‍රජා හා දේශපාලන අයිතීන් නීත්‍යානුකූල අන්දමින් ආරක්ෂා කරන්නට ඇප කැපවී සිටිනවා නම් පමණි. එබැවින්

ප්‍රජාතන්ත්‍රීයකරණ ක්‍රියාමාර්ගය සඳහා කළ යුතු වැඩ කොටස කවදාවත්ම නිමවන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම සාක්ෂාත් කරගැනීමටත් තහවුරුකර ගැනීමටත් ප්‍රජාතන්ත්‍රවාදීන් ලෝක පරිමාණ වශයෙන් අරගල කරන්නේ ඒ නිසාය. යහපත් ආණ්ඩුකරණය නම් සංකල්පය අදාළ වන්නේ මෙහිදීය. මහජන සේවා ජනමාධ්‍ය නම් සංකල්පය අදාළ වන්නේ මෙහිදීය.

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය වන්නේ දැනුවත් තීරණ ගත හැකි පුරවැසියෙකි. ''සමාජය තේරුම් ගැනීම සඳහා සමාජයට ආධාර කිරීම'' ජනමාධ්‍යයේ ප්‍රධාන වටිනාකමක් වන්නේ එහෙයිනි. බලයේ ස්වාධීන නිරීක්ෂකයාගේ කාර්ය භාරයත් මුරපල්ලාගේ කාර්යයක් ජනමාධ්‍යයේ කාර්යය වන්නේ එහෙයිනි.

ප්‍රජාතන්ත්‍රවාදයේ ජීව වායුව තොරතුරුය. තමන්ගේ සමාජයේ සිදුවන්නේ කුමක්දැයි ජනතාව නොදන්නේ නම්, ඔවුන් පාලනය කරන්නන්ගේ ක්‍රියා වසන් කරන්නේ නම්, ජනතාවට එම සමාජයේ කටයුතුවලට ඵලදායක ලෙස දායක විය නොහැකිය. තොරතුරු ජනතාවගේ පමණක් නොව යහපත් ආණ්ඩුවකටද අත්‍යවශ්‍ය අංගයකි.

එහෙත් තවමත් මෙරට තොරතුරු සම්බන්ධයෙන් ඇත්තේ රහසිගත සංස්කෘතියකි. තොරතුරු ඉල්ලා සිටීමත්, ලබාගැනීමත් රටෙහි පාලන ක්‍රියාවලියට පොදු ජනයා සම්බන්ධ වීමේ වැදගත් පියවරකි. ඒවා ලබා දීම යනු ආණ්ඩු පාලනයේ විනිවිද පෙනෙන සුළු භාවය පවත්වා ගැනීමයි. තොරතුරු ලබා ගැනීමෙන් පසු යෝජිත පරිදි, ගමේ-නගරයේ, පළාතේ සහ රටේ කටයුතු හරියාකාරව සිදුවන්නේ දැයි පුරවැසියන්ට සෙවිල්ලෙන් සිටිය හැකිය. එම කටයුතු හරියාකාරව සිදු නොවන්නේ නම් ඊට වගකිව යුත්තේ කවුරුන්දැයි හරියටම දැනගැනීමට පුරවැසියන්ට අයිතියක් තිබේ. එය පාලනයේ වගකිව යුතු භාවය පවත්වා ගැනීමයි. තීරණ ගැන දැන ගැනීමටත්, ප්‍රශ්න, සිදුවීම් යනාදිය පිළිබඳව අවබෝධ කර ගැනීමටත්, විවිධ කටයුතු පිළිබඳව දැන සිටීමට සහ එවාට වගකිව යුතු අය දැන ගැනීමටත් අපට තොරතුරු අවශ්‍යය. තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය යහපත් ආණ්ඩුකරණයක මුල්ගලක් හා සමානය.

කෙසේ වෙතත් බොහෝ ආණ්ඩු රහසිගතව සිය කටයුතු කරගෙන යෑමට වැඩි රුචියක් දක්වති. නරක ආණ්ඩුවලට සිය පැවැත්ම සඳහා රහස්‍යභාවය අත්‍යවශ්‍ය අංගයකි. අකාර්යක්ෂමතාවය, නාස්තිය හා දූෂණය වර්ධනය වන්නට එය ඉඩ ලබා දෙයි. අප්‍රිකානු බසක් වන 'ස්වාහිලි' බසින් ආණ්ඩු යන්නට යෙදෙන පදයක් වන්නේ 'බිහිසුණු රහස' යන්නය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු පවා ඔවුන්ගේ කටයුතුවලින් සෑහෙන ප්‍රමාණයක් සිදුකරනු ලබන්නේ ජනතාවගේ ඇස් වසාය. එසේ රහස් කටයුතු කිරීමට හා පවත්වාගෙන යෑමට ආණ්ඩු නිරන්තරයෙන් හේතු සොයා ගනිති. ජාතික ආරක්ෂාව, මහජන සුභ සිද්ධිය සඳහා, නීතිය හා සාමය ආරක්ෂා කිරීම ආදිය එසේ දක්වන හේතු අතරින් කිහිපයකි. වර්තමානයේ වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති හේතුව නම් ත්‍රස්තවාදය වැළැක්වීමය. සැප්තැම්බර් 11 සිදුවීමෙන් පසු දියුණු ලෝකයේ රටවල හිතුවක්කාරී ආණ්ඩු 'ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය' නම් සටන් පාඨය පෙරට දමා රටවල තොරතුරු සම්බන්ධයෙන් රහස්‍ය සංස්කෘතියක් පවත්වාගෙන යෑමට උත්සාහ ගනිති. එහෙත් තොරතුරු ලබාගැනීමේ අයිතිය සහතික කෙරෙන නීති නොමැති අප වැනි රටවලට එම සටන් පාඨය පැමිණ ඇත්තේ වඩාත් මුග්ධ අයුරිනි.

ඉරාකයට පහර දීම සඳහා යොදා ගත් තර්කය වූයේ ඉරාකය සතුව ජීව රසායනික අවි ඇතැයි යන්නය. එහෙත් අද වන විට මුළු ලෝකයම දන්නා කරුණක් නම් ඉරාකය සතුව එවැනි අවි නොමැති බවය. එහෙත් ඉරාකයට පහර දීමට පටන් ගත් අවධියේම බ්‍රිතාන්‍යයේ බීබීසි ආයතනය

විසින් හෙළිදරව් කරන ලද්දේ ඉරාකය සතුව ජීව රසායනික අවි ඇති බවට බොරු වාර්තාවක් සකස් කර ප්‍රසිද්ධියට පත් කරන ලද්දේ ආණ්ඩුවේ වුවමනාවට බවය. බීබීසී ආයතනය ප්‍රමුඛ ජනමාධ්‍යයට එසේ කළ හැකි වූයේ එක්සත් රාජධානියේ සිටින බලය අනිසි ලෙස පරිහරණයට එරෙහි රාජ්‍ය නිලධාරීන්ගේද, ජනමාධ්‍යවේදීන්ගේද, ප්‍රජාතන්ත්‍රවාදයට ලැදි බලවේගයන්ගේද අප්‍රතිහත ධෛර්යය නිසාය.

අප රටේ දී වරින් වර සුළු පරිමාණයෙන් හෝ ආණ්ඩුවේ දූෂණ, බලය අයුතු ලෙස පරිහරණය කිරීම් මාධ්‍ය මගින් එළිදරව් වන්නේ 'ගවේෂණාත්මක මාධ්‍යක' ඇති ප්‍රතිඵලයක් ලෙස නොවු එවැනි දෑට එරෙහි රාජ්‍ය නිලධාරීන්ගේ උපකාරය හේතුවෙනි. එහෙත් තවමත් අප රටේ බොහෝ රාජ්‍ය නිලධාරීන් සහය දෙනු ලබන්නේ දූෂිත ආණ්ඩු විසින් පවත්වා ගැනීමට උත්සාහ දරන තොරතුරු සම්බන්ධ රහස්‍ය සංස්කෘතියටය. බලය අනිසි ලෙස පරිහරණය කිරීම, සමාජ දේශපාලන සදාචාරය පිරිහී ගොස් දූෂණය, වංචාව, ඥාති සංග්‍රහය හා ප්‍රචණ්ඩත්වය ඉහවහා යෑම යනාදිය නීතියේ පාලනය බිඳවැටීමේ උල්පත්ය. මහජනයාට රාජ්‍ය පාලනය විනිවිද යා හැකි යාන්ත්‍රණයක් නැති වීම, බලය අනිසි ලෙස පරිහරණය කිරීමේ ක්‍රියාදාමයේ ප්‍රධාන රුකුලය. ඕනෑම සමාජයක සිදුවන මෙම පරිහානි ක්‍රියාදාමය වැළැක්වීමට දැනුවත් පුරවැසි සමාජයක් ඇති වන්නේ තොරතුරු නිදහසේ ලබාගත හැකි වාතාවරණයක් තුළය.

ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයත් සමඟ එක්ව පවත්වන ලද සමීක්ෂණයක ප්‍රතිපල 'සෑම දෙනාම සඳහා වාර්තාකරණය' නමින් එළිදක්වා ඇත. එයට අනුව 'ප්‍රවෘත්ති වාර්තා වලින් 50% කට වඩා ඇත්තේ තනි මූලාශ්‍රයේ ප්‍රවෘත්තිය' තනි මූලාශ්‍රයේ ප්‍රවෘත්ති මඟින් 'සමාජය තේරුම් ගැනීම සඳහා සමාජයට ආධාර වීමේ' මහජන සේවා ජනමාධ්‍ය මුලධර්මය ඉටුවන්නේ නැත. එය ඉටු කිරීම සඳහා කතාවක සෑම පැත්තක්ම ආවරණය කළ යුතුය. මෙම දුර්වලතාවය හේතු කොටගෙන ජනමාධ්‍යයට පමණක් දොස් පැවරීමේ තේරුමක් නැත. මෙරට යහපත් ජනමාධ්‍යයක් ඇති කිරීම සඳහා යහපත් රාජ්‍ය නිලධාරීන්ගේද සහය අවශ්‍යය.

තොරතුරු ලබාගැනීමේ අයිතිය සහතික කරන නීතියක් නොමැතිව වුවද රජයේ නිලධාරීන්ට ලබා දිය හැකි තොරතුරු බොහෝය.

අඩුම තරමින් එම සීමාවේ සිටවත් තොරතුරු ලබාදෙන්නේ නම් අනාගත රාජ්‍ය නිලධාරීහු තම සීමාව නිසැක වශයෙන්ම පුළුල් කරනු ඇත. වෙනසක් කිරීමට අවශ්‍ය නම් වෙනස පටන්ගත යුත්තේ තමන්ගෙන්ය. ලෝකයේ සෑම යහපත් දෙයක්ම සිදුව ඇත්තේ, විශාල මහජන ව්‍යාපාර බිහිව ඇත්තේ, තමන් 'හොඳ'යැයි සිතන දෙයක් තවත් කෙනෙකුට පැවසීම මගිනි. යහපත් පාලනයක් අවශ්‍ය යැයි සිතන රාජ්‍ය නිලධාරීහු සිටී නම්, ඒ සඳහා පරාදෘශ්‍ය භාවය අවශ්‍ය සිතන රාජ්‍ය නිලධාරීහු සිටී නම්, ඒ සඳහා ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතියක් ඇතැයි සිතන රාජ්‍ය නිලධාරිහු සිටීනම් වෙනස ඇති කිරීම තමන්ගෙන්ම පටන් ගත යුතුය. වෙනස ඇති වන්නේ තමා සමඟිනි යන්න සිහිපත් කළ යුතුය.